# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2083/4 - 2018 අගෝස්තු මස 07 වැනි අඟහරුවාදා - 2018.08.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

07 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකයː-3/6/2016/7(2/2018).*
*ඉඩම් අමාත්‍යාශයේ යොමු අංකයː-4-3/7/2016/HW/140.*

පොදුජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම් පරවශතාවයන් රජයට අත්කරගෙන ඇත. ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දන්වා සිටිමි.

අත්කරගෙන ඇති ඉඩම් විස්තරය,

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 888 දෙවටේගදර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නිල්ලක්කේගම ගමේ පිහිටි සර්වේ ජෙනරාල් වෙනුවෙන් කුරුණෑගල කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක කු 2395 හා 2018.06.25 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 02 දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0205 ක් වූ පහත දක්වා ඇති ඉඩම් කැබලි දෙක (02).

**කැබලිඅංක 01**
ඉඩමේ නමː වරාගස්පිටියහේන, ඇස්වැද්දුමවත්ත; ඉඩම් පරිහරණයː වත්ත, තාවකාලික වගාවක් ඇත; හිමිකම් පාන්නාː රජය; මුල් හිමිකම් පාන්නාː 135/5, දිග්ගලේ වත්ත, කොළඹ පාර, පොතුහැර හි පදිංචි කේ.පී.එච්. දයා මැණිකේ හේරත්; ප්‍රමාණයː හෙක්ටයාර් 0.0068.

**කැබලිඅංක 02**
ඉඩමේ නමː ඇල්හේන, අඹගහමුලහේන; ඉඩම් පරිහරණයː වත්ත, තාවකාලික වගාවක් ඇත; හිමිකම් පාන්නාː රජය; මුල් හිමිකම් පාන්නාː නිල්ලක්කේගම, ලිඳකඹුර, මහපිටිය, පොතුහැර හි පදිංචි ජී. ශ්‍රියානි පුෂ්ප කුමාරි; ප්‍රමාණයː හෙක්ටයාර් 0.0137.

මෙම ඉඩම්/පරවශතාවන් කැබලි සඳහා අයිතිවාසිකම් කියන සියලු දෙනාම තමන්ගේ නම් ගැසට් පත්‍රයේ පළවී ඇතත්, නැතත් එම ඉඩම්/පරවශතාවන් සම්බන්ධයෙන් තමන්ට ඇති අයිතිවාසිකම්, එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම ; පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් එම ඉඩම්වලට/ පරවශතාවන් ඇති ස්වකීය අයිතියේ ස්වභාවය, එම ඉඩම්/පරවශතාවන් කැබලිවල අයිතිය වෙනුවෙන් තමන්ට ඉදිරිපත් කළහැකි කරුණු පිළිබඳ විස්තරයක් 2018.07.19 දින මගේ කාර්යාලයේ දී මා හමුවී ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව 2018.08.08 දින සිට මා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී තමන් විසින් ම නැතහොත් ලිඛිතව බලය පවරනු නියෝජිතයෙකු මගින් නියමිත දින නියමිත වේලාවට, අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන අනෙකුත් ලියවිලි සමග මා විසින් නියම කරනු ලබන ස්ථානයක දී පනතේ 09 වැනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය.


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

පරීක්ෂණය සඳහා නියෝජිතයෙකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලයපවරන ලද ලිපියක් නොමැතිව ඔහුගේ/ඇයගේ ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් කරගනු නොලබන බව අවධාරණය කරමි.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2018 අගෝස්තු මස 02 වැනි දින
පොල්ගහවෙල,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

08-714

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

07 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : 4/1/1/32-E.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2015/HW/69.

පොදුජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම් පරවශතාවයන් රජයට අත්කරගෙන ඇත. ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දන්වා සිටිමි.

අත්කරගෙන ඇති ඉඩම් විස්තරය :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් අංක 808, වෙහෙරබැන්ද සහ අංක 836, තෙලියාගොන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසවල අම්බලන්පිටිය ගමේ පිහිටි සර්වේ ජෙනරාල් වෙනුවෙන් කුරුණෑගල කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක කු 2366 හා 2018.05.28 දරන මූලික පිඹුරේ කැබලි අංක 130 සිට 131 දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.5457 ක් වූ පහත දක්වා ඇති ඉඩම් කැබලි දෙක (02).

**කැබලි අංක 130**
ඉඩමේ නම: කොලපැලැල්ලකන්දවත්ත; ඉඩම් පරිහරණය: වත්ත සහ මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: කුරුණෑගල, කොළඹ පාර, අංක 79/18 හි පදිංචි එච්.පී.එන්.කේ. පතිරණ සහ පී.එස්.බී. මොනරවිල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1029.

**කැබලි අංක 131**
ඉඩමේ නම: කොලපැලැල්ලකන්දවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත සහ මිශ්‍ර වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: දිවුලපිටිය, කොළඹ පාර, අංක 115 හි පදිංචි එම්.ටී. නුවන් ගීතාල් පෙරේරා; ප්‍රමාණය:- හෙක්ටයාර් 0.4428.

මෙම ඉඩම් කැබලි සඳහා අයිතිවාසිකම් කියන සියලු දෙනාම තමන්ගේ නම් ගැසට් පත්‍රයේ පළවී ඇතත්, නැතත් එම ඉඩම් සම්බන්ධයෙන් තමන්ට ඇති අයිතිවාසිකම්, එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම ; පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් එම ඉඩම්වලට ඇති ස්වකීය අයිතියේ ස්වභාවය, එම ඉඩම් කැබලිවල අයිතිය වෙනුවෙන් තමන්ට ඉරිදිපත් කළහැකි කරුණු පිළිබඳ විස්තරයක් 2018.08.05 දින මගේ කාර්යාලයේ දී මා හමුවී ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව 2018.08.30 දින සිට මා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී තමන් විසින් ම නැතහොත් ලිඛිතව බලය පවරනු නියෝජිතයෙකු මගින් නියමිත දින නියමිත වේලාවට, අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන අනෙකුත් ලියවිලි සමග මා විසින් නියම කරනු ලබන ස්ථානයක දී පනතේ 09 වැනි වගන්තිය යටතේ හිමිකම් පරික්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය.

පරීක්ෂණය සඳහා නියෝජිතයෙකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලය පවරන ලද ලිපියක් නොමැතිව ඔහුගේ/ඇයගේ ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් කරගනු නොලබන බව අවධාරණය කරමි.

ඊ.එම්.එම්.එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2018 අගෝස්තු මස 02 වැනි දින
කුරුණෑගල, ප්‍රාදේශීයලේකම් කාර්යාලයේ දීය.

08-715

---

## ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනත**

07 වැනි වගන්තිය යටතේ දැන්වීම

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නවදුන් කෝරලය මැදපත්තුව සුළු කොට්ඨාසයේ නිවිතිගල ගමේ පිහිටි අ.ග.සි. 36 ඉහළ රදාලියද්ද, රදාලියද්ද අස්වැද්දුම, මහකුඹුර අස්වැද්දුම නමැති ඉඩම පොදු කටයුතු සඳහා නිවිතිගල ප්‍රාදේශිය සභාවට අත්කර ගැනීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තිය යටතේ අංක 1622/23 හා 2009.10.07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* හා 1980/28 හා 2016.08.16 දිනැති *ගැසට් පත්‍රය* මඟින් සංශෝධනය කරන ලද ශුද්ධි පත්‍රිකාවේ සඳහන් කර ඇති ''හිමිකම් පරීක්ෂණය නැවත 2018.10.08 දිනයේදී මා සම්මුඛව පැවැත්වෙන බව මෙයින් සඳහන් කරමි''.

ප්‍රාදේශීය ලේකම්,
නිවිතිගල.

08-716

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.